පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2026.04.23 පැය 1745 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/650 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.
பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறிக்கையிடப்பட்ட முக்கிய தகவல்கள்

01. මනුෂ්‍ය ඝාතනයක් - ආණමඩුව පොලිස් වසම.

2026.04.22 දින රාත්‍රී කාලයේ ආණමඩුව පොලිස් වසමේ කොතලකෙමියාව ප්‍රදේශයේදී පහරදීමක් හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු ආණමඩුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ආණමඩුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මරණකරු වයස අවුරුදු 58 ක් වූ කොතලකෙමියාව, ආණමඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මරණකරු නිවසට පැමිණ ඔහුගේ පුත්‍රයා සමඟ ඇතිකර ගත් ආරවුලක් අතරතුර පුත්‍රයා විසින් සිදුකල පහරදීමක් හේතුවෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. වයස අවුරුදු 26 ක් වන සැකකාර පුත්‍රයා අත්අඩංගුවට ගෙන ඇත.

ආණමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

கொலைச் சம்பவம் – ஆணமடுவ பொலிஸ் பிரிவு

2026.04.22 அன்று இரவு, ஆணமடுவ பொலிஸ் பிரிவிற்குட்பட்ட கொத்தலகெமியாவ பகுதியில் நடந்த தாக்குதல் சம்பவத்தில் காயமடைந்த ஒருவரை ஆணமடுவ மருத்துவமனைக்கு அனுமதித்த பின்னர் அவர் உயிரிழந்ததாக கிடைத்த தகவலின் அடிப்படையில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.

இறந்தவர் 58 வயதுடையவர்; அவர் ஆணமடுவ, கொத்தலகெமியாவ பகுதியில் வசித்தவர் ஆவார்.

இறந்தவர் வீட்டிற்கு வந்தபோது தனது மகனுடன் ஏற்பட்ட தகராறின் போது, மகனால் மேற்கொள்ளப்பட்ட தாக்குதலின் காரணமாக இந்தக் கொலை சம்பவம் நிகழ்ந்ததாக இதுவரை மேற்கொள்ளப்பட்ட விசாரணைகளில் தெரியவந்துள்ளது.

26 வயதுடைய சந்தேகநபரான மகன் கைது செய்யப்பட்டுள்ளார். ஆணமடுவ பொலிசார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.

2026.04.23 දින දහවල් වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේ නිවසක් පරීක්ෂා කර හෙරොයින් කිලෝග්‍රෑම් 03 ග්‍රෑම් 150 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු වයස අවුරුදු 49 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම මත්ද්‍රව්‍ය තොගය දැනට විදේශ ගතව සැඟව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුට අයත් බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.

ஹெரோயின் உடன் சந்தேகநபர் கைது – வலானா ஊழல் தடுப்பு சிறப்பு அதிரடி பிரிவு

2026.04.23 அன்று மதியம், வலானா ஊழல் தடுப்பு சிறப்பு அதிரடி பிரிவு அதிகாரிகள் பெற்ற தகவலின் அடிப்படையில், கல்கிசை பொலிஸ் பிரிவிற்குட்பட்ட இரத்மலானா பகுதியில் உள்ள ஒரு வீட்டை சோதனை செய்து ஹெரோயின் 3 கிலோ 150 கிராம் உடன் ஒருவரை கைது செய்துள்ளனர்.

சந்தேகநபர் 49 வயதுடையவர்; அவர் தெஹிவள பகுதியில் வசிப்பவர் ஆவார்.

மேற்கொள்ளப்பட்ட விசாரணைகளின் அடிப்படையில், இந்த போதைப்பொருள் கையிருப்பு தற்போது வெளிநாட்டில் ஒளிந்து இருக்கும் ஒழுங்கமைக்கப்பட்ட குற்ற மற்றும் போதைப்பொருள் கடத்தல் குழுவைச் சேர்ந்த ஒருவருக்குச் சொந்தமானது என்று தெரியவந்துள்ளது.

வலானா ஊழல் தடுப்பு சிறப்பு அதிரடி பிரிவு மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகிறது.

பொலிஸ் ஊடகப் பிரிவு